# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2312/16 - 2022 දෙසැම්බර් මස 28 වැනි බදාදා - 2022.12.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

83අ වගන්තිය යටතේ නිවේදනය

2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධිත) පනත සහ 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධිත) පනත මගින් සංශෝධිත 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතෙහි පළමුවන උපලේඛනයෙහි 10 වන ඡේදයෙහි (1) වන උපඡේදයෙහි (අ) අයිතමය සමග කියවිය යුතු 83අ වගන්තියෙහි (1අ) ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් දොන් රංජිත් සිසිරකුමාර හපුආරච්චි වන මවිසින්, මෙම නිවේදනය මගින් යම් සේවා නියුක්තිකයකු වෙත සිදුකරනු ලබන ගෙවීම් වලින්, බද්ද රඳවාගනු ලැබිය යුතු අවස්ථා සහ එම ගෙවීම්වලින් රඳවාගනු ලැබිය යුතු බදු අනුප්‍රමාණයන් නිශ්චිතව දක්වනු ලැබේ.

**ඩී. ආර්. එස්. හපුආරච්චි,**
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2022 දෙසැම්බර් 20 වැනි දින,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
කොළඹ 02.

**නියෝග**

***සේවායෝජකයන් විසින් රඳවාගැනීම***

1. **ලුහුඬු නාමය සහ ආරම්භය**

මෙම නියෝග "2023 සේවායෝජකයන් විසින් රඳවා ගැනීමේ නියෝග" යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2023 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.


1A - G 38460 — 07 (2022/12)


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2. සේවායෝජකයන් විසින් රඳවාගනු ලැබිය යුතු මුදල් ප්‍රමාණ**

යම් තක්සේරු වර්ෂයක් තුළ, සේවා යෝජකයකු විසින් සේවා නියුක්තිකයකුගේ සේවා නියුක්තිය වෙනුවෙන් සිදු කරනු ලබන එම ගෙවීම් වලින්, පහත තත්ත්වයන්ට අනුකූලව අදාළ මුදල් ප්‍රමාණයන් රඳවා ගනු ලැබිය යුතු ය.

(අ) එක් සේවා නියුක්තියක් ඇති සේවා නියුක්තිකයෙකුගේ සේවා නියුක්තිය මගින් වන නිත්‍ය ලාභවලින් ගෙවීම සමන්විත වන විට සහ සේවා නියුක්තිකයා විසින් ප්‍රාථමික සේවා නියුක්ති ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති විට,
**01 වන බදු චක්‍රය අදාළ කර ගත යුතු ය.**

(ආ) ගෙවීම එකවර ගෙවීම්වලින් සමන්විත වන විට
**02 වන බදු චක්‍රය අදාළ කර ගත යුතු ය.**

(ඇ) ගෙවීම එක් වතාවක් පමණක් කරන ගෙවීම්වලින් (ආන්තික ප්‍රතිලාභ) සමන්විත වන විට
**03 වන බදු චක්‍රය අදාළ කර ගත යුතු ය.**

(ඈ) ගෙවීම ශ්‍රී ලංකාවේ නිර්වාසික සහ පුරවැසි නොවන සේවා නියුක්තිකයන් විසින් ලබාගන්නා විට
**04 වන බදු චක්‍රය අදාළ කර ගත යුතු ය.**

(ඉ) සේවා නියුක්තිකයකුගේ, ප්‍රාථමික සේවා නියුක්තියෙන් ලැබෙන මාසික නිත්‍ය ලාභ රු.100,000ට වඩා අඩු වන නමුත් ඇතැම් මාසවල ඉහළ පාරිශ්‍රමික ගෙවීම හේතුවෙන් සලකා බලනු ලබන කාල පරිච්ඡේදයේ යම් මාසයක් දක්වා ප්‍රාථමික සේවා නියුක්තියෙන් ලැබෙන සමුච්චිත ලාභය බදු අය කළ හැකි ආදායම් බැඳියාව ඉක්මවන විට එබඳු අවස්ථාවලදී,
**05 වන බදු චක්‍රය අදාළ කර ගත යුතු ය.**

(ඊ) සේවානියුක්ති ආදායම මත සේවා නියුක්තිකයාගේ බදු බැඳියාව, සේවායෝජකයන් විසින් ගෙවීම හෝ ප්‍රතිපූරණය කිරීම යන ගෙවීමකින්, සේවානියුක්ති ගෙවීම සමන්විත වන අවස්ථාවක දී,
**06 වන බදු චක්‍රය අදාළ කර ගත යුතුය.**

(උ) ප්‍රාථමික සේවා නියුක්ති ප්‍රකාශය සපයා නොමැති යම් සේවා නියුක්තිකයකු වෙත හෝ එක් සේවායෝජකයෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් යටතේ සේවයෙහි නිරත යම් සේවා නියුක්තිකයකු වෙත හෝ සේවා නියුක්තිකයකු එක් සේවා නියුක්තියකට වඩා වැඩි සංඛ්‍යාවක නිරතව සිටින විට, ප්‍රාථමික සේවා නියුක්තියේ සේවායෝජකයා හැර වෙනත් යම් සේවායෝජකයකු විසින් ගෙවීම කරනු ලබන අවස්ථාවලදී,
**07 වන බදු චක්‍රය අදාළ කර ගත යුතු ය.**

***www.ird.gov.lk*** *යන දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් ද්වාරයෙන් බදු චක්‍ර ලබා ගත හැක.*

**3. ප්‍රාථමික සේවා නියුක්තිය**

i. තක්සේරු වර්ෂයක් සඳහා සේවා නියුක්තිකයකුගේ ප්‍රාථමික සේවා නියුක්තිය යනු එම තක්සේරු වර්ෂය සඳහා සේවා නියුක්තිකයා විසින් සේවායෝජකයෙකු වෙත (ii) අයිතමය යටතේ සපයා තිබෙන ප්‍රකාශයකට අදාළ වන සේවා නියුක්තිය වේ.
ii. එක් සේවා නියුක්තියක් ඇති සේවා නියුක්තිකයෙකු හැර අනිකුත් සේවා නියුක්තිකයින් විසින් තම සේවා නියුක්තිය ප්‍රාථමික සේවා නියුක්තිය බවට නම් කර ප්‍රකාශයක් සේවා යෝජකයාට ලබාදිය යුතු ය.
iii. අයිතම (ii) යටතේ වන ප්‍රකාශයක් සේවා නියුක්තිකයා සහ සේවා යෝජකයා විසින් අත්සන්කර දාතම යොදා තිබිය යුතු අතර, තක්සේරු වර්ෂ එකකට හෝ වැඩි සංඛ්‍යාවකට අදාළ විය හැක.
iv. යම් එක් අවස්ථාවක දී සේවා නියුක්තිකයකු සතුව, එක් ප්‍රාථමික සේවා නියුක්තියකට වඩා වැඩි සංඛ්‍යාවක් නොතිබිය යුතුය.
v. 4 වන ඡේදයට යටත් ව, තක්සේරු වර්ෂයක් අවසානයේ දී පමණක් අයිතමය (ii) යටතේ වන ප්‍රකාශයක් සේවා නියුක්තිකයකුට ඉවත් කර ගත හැක.

**4. අනුගාමී ප්‍රාථමික සේවා නියුක්තිය**

i. යම් තක්සේරු වර්ෂයක් තුළ දී සේවා නියුක්තිකයෙකු තම ප්‍රාථමික සේවා නියුක්තිය අවසන් කරන්නේ නම් සහ එම ප්‍රාථමික සේවා නියුක්තියෙන් පසුව වෙනත් සේවා නියුක්තියක නිරත වන්නේ නම් එම අනෙක් සේවා නියුක්තිය සම්බන්ධයෙන් සේවායෝජකයා වෙත පහත ලිපිලේඛන සැපයිය යුතු ය.

අ) 3 ඡේදයෙහි (ii) අයිතමය යටතේ වන නව ප්‍රකාශයක්

ආ) පූර්ව ප්‍රාථමික සේවා නියුක්තියට අදාළව 7 වන ඡේදය යටතේ නිකුත්කරන ලද රඳවාගැනීමේ බදු සහතිකය

ii. (i) වන අයිතමය යටතේ රඳවාගැනීමේ බදු සහතිකයක් සේවායෝජකයාට ලබාදුන් පසු එලෙස එය භාරදුන් දින සිට දින 7ක් ඇතුළත සේවායෝජකයා විසින් එම සහතිකය නැවත සේවා නියුක්තිකයා වෙත ලබා දිය යුතු ය.

iii. (i) වන අයිතමය අදාළ වන විට, නව සේවායෝජකයා විසින් (තක්සේරු වර්ෂයේ ඉතිරි කාලය තුළ සේවා නියුක්තිකයා වෙත සිදු කළ යුතු ගෙවීම්වලින් 2 ඡේදය යටතේ රඳවාගත යුතු බද්ද ගණනය කිරීමේ කාර්යය සඳහා).

අ) වර්ෂය සඳහා නව ප්‍රාථමික සේවා නියුක්තියෙන් ලැබෙන ගෙවීම්වලට රඳවාගැනීමේ බදු සහතිකයේ සඳහන් වන සේවා නියුක්තිකයාගේ පූර්ව ප්‍රාථමික සේවා නියුක්තියෙන් ලැබෙන ගෙවීම් එකතු කළ යුතු ය.

ආ) සේවා නියුක්තිකයා වෙත සිදු කරනු ලබන ගෙවීම්වලින් වර්ෂය තුළ දී නව ප්‍රාථමික සේවායෝජකයා විසින් රඳවාගත යුතු ලෙස සැලකෙන බද්දට සේවා නියුක්තිකයාගේ පූර්ව ප්‍රාථමික සේවායෝජකයා විසින් රඳවාගනු ලැබූ ලෙස රඳවාගැනීමේ බදු සහතිකයේ සඳහන් වී ඇති බදු ප්‍රමාණය එකතු කළ යුතුය.

iv. සේවා නියුක්තිකයකු විසින් තක්සේරු වර්ෂයක් තුළ ප්‍රාථමික සේවා නියුක්තීන් දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් අවසන් කරනු ලබන අවස්ථාවක දී

අ) සේවා නියුක්තිකයා විසින් (i) අයිතමය යටතේ එම රඳවාගැනීමේ බදු සහතික නව සේවායෝජකයා වෙත සපයනු ලැබිය හැක.

ආ) (iii) වන අයිතමය එම රඳවාගැනීමේ බදු සහතික පත්‍ර සඳහා අදාළ වේ.

**5. ද්විතියික සේවා නියුක්තිය**

සේවා නියුක්තිකයකුට අදාළව ද්විතියික සේවා නියුක්තිය යනුවෙන් අදහස් වනුයේ එම සේවා නියුක්තිකයාගේ ප්‍රාථමික සේවා නියුක්තිය නොවන ඕනෑම සේවා නියුක්තියකි.

**6. සේවායෝජකයාගේ වාර්ෂික ප්‍රකාශනය**

I. සේවා යෝජකයකු විසින් සකස්කර කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන වාර්ෂික ප්‍රකාශනය පහත විස්තර වන පරිදි නියමිත ආකෘති පත්‍රයෙන් සමන්විත යුතු ය.

i. වර්ෂය තුළ දී සේවායෝජකයා විසින් සේවයෙහි යොදවා ඇති එක් එක් සේවා නියුක්තිකයාගේ නම, සේවා අංකය සහ ජාතික හැඳුනුම්පත් අංකය

ii. එක් එක් සේවා නියුක්තියට අදාළව සේවා නියුක්තිය, ප්‍රාථමික සේවා නියුක්තියක් ද ද්විතියික සේවා නියුක්තියක් ද යන වග

iii. එක් එක් සේවා නියුක්තිකයාට අදාළව වර්ෂය තුළ දී සේවායෝජකයා විසින් සිදු කරන ලද ගෙවීම්

iv. ගෙවීම්වලින් රඳවාගනු ලැබූ මුදල් ප්‍රමාණය

II. නිත්‍ය සේවා නියුක්ති ලාභ, එකවර ගෙවීම් සහ අනෙකුත් ගෙවීම් සම්බන්ධ විස්තර කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන උපලේඛන මගින් සැපයිය යුතු ය.

III. ඊ-සේවාව හරහා උපලේඛන උඩුගත කළයුතුය. කෙසේ නමුදු, වාර්තාවන් 20 ට අඩු නම් දෘඩ පිටපත් ලෙස ද භාරදිය හැකිය.

**7. සේවා නියුක්තිකයාගේ රඳවාගැනීමේ බදු සහතික**

පනතෙහි 87 වන වගන්තිය යටතේ සේවා නියුක්තිකයකු පිළිබඳව සේවායෝජකයෙකු විසින් සකස්කර බාරදෙනු ලබන රඳවාගැනීමේ බදු සහතිකයක් පහත විස්තර වන පරිදි නියමිත ආකෘති පත්‍රයෙන් සමන්විත විය යුතු ය.

i. සේවා නියුක්තිකයාගේ නම, සේවා අංකය සහ ජාතික හැඳුනුම්පත් අංකය
ii. සේවා නියුක්තිකයාට අදාළව සේවා නියුක්තිය ප්‍රාථමික සේවා නියුක්තියක් ද ද්විතියික සේවා නියුක්තියක් ද යන වග
iii. තක්සේරු වර්ෂය තුළ දී සේවා නියුක්තිකයා වෙත සේවා නියුක්තියෙන් ලැබුණු ගෙවීම් මුදල් ප්‍රමාණය
iv. ගෙවීම්වලින් රඳවාගනු ලැබූ බදු මුදල් ප්‍රමාණය

**8. අසත්‍ය හෝ නොමග යවන සුළු ප්‍රකාශ**

පනතෙහි 181 වන වගන්තියෙහි කාර්යය සඳහා, සේවා නියුක්තිකයෙකු විසින් සේවායෝජකයෙකු වෙත හෝ සේවායෝජකයෙකු විසින් සේවා නියුක්තිකයෙකු වෙත මෙම නියෝග යටතේ සපයන ලද ප්‍රකාශනයක්, ප්‍රකාශයක් හෝ සහතිකයක්, බදු නිලධරයෙකු වෙත සිදු කරන ලද ප්‍රකාශයක් ලෙස සැලකේ.

**9. සේවායෝජකයන් නිසි පරිදි වාර්තා පවත්වාගෙන යාම**

ඕනෑම සේවා නියුක්තිකයෙකු වෙත යම් පාරිශ්‍රමික ගෙවීමක් සිදු කරන සෑම සේවායෝජකයෙකු විසින් ම,

(*අ*) එවැනි පාරිශ්‍රමික ගෙවීමක වාර්තා නිසි පරිදි පවත්වාගෙන යා යුතු ය.

(*ආ*) සියලු සේවා නියුක්තිකයන්ගේ ප්‍රකාශන, වැටුප්පත්, සේවා නියුක්තිකයන් වෙත පාරිශ්‍රමික ගෙවීමේ ලදුපත් සහ සේවා නියුක්තිකයන්ගේ පාරිශ්‍රමික සහ කොමසාරිස් ජනරාල්වරයා වෙත සිදු කරනු ලැබූ ආදායම් බදු අඩුකිරීම් සහ ගෙවීම්වලට අදාළ වෙනත් සියලු ගිණුම් වාර්තා ආරක්ෂිතව පවත්වා ගැනීම සඳහා සියලු සාධාරණ පූර්වෝපායයන් අනුගමනය කළ යුතු ය.

(*ඇ*) එම සියලු වාර්තා අදාළ වන තක්සේරු වර්ෂය අවසන් වීමෙන් අනතුරුව වසර පහකට නොඅඩු කාල පරිච්ඡේදයක් සඳහා පවත්වා ගත යුතු ය.

(*ඈ*) (අ) හෝ (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් ඔහු විසින් පවත්වාගෙන යනු ලබන යම් වාර්තාවක් පරීක්ෂා කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් ලිඛිතව බලය පවරන ලද යම් නිලධාරියෙකු වෙත අවසර ලබාදිය යුතු ය.

EOG 12-0367